(2) කැලි ප්‍රමාණය අනුව හෝ දින ප්‍රමාණය අනුව ගෙවීමේ පදනම මත කම්කරුවකු සේවයෙහි නියුක්ත කර ඇති අවස්ථාවක, මේ නියෝග යටතේ ගෙවිය යුතු ප්‍රමාණය, අවස්ථාවෝචිත පරිදි, කැලි ප්‍රමාණය අනුව හෝ දින ප්‍රමාණය අනුව ගෙවීමේ පදනම මත ඔහුට ගෙවිය යුතු වේතනයෙන් සියයට හයකට නොඅඩු මුදලක් විය යුතු ය. එතෙකුදු වුවත්, මේ ඡේදය යටතේ ගෙවිය යුතු ප්‍රමාණය මාසයකට රුපියල් පහළොවක් නොඉක්මවිය යුතු ය.

(3) මාසය සඳහා මුළු ඉපයුම, රුපියල් අටසියය ඉක්මවන එහෙත් රුපියල් අටසිය අනූවකට අඩු කම්කරුවකුගේ සෑම සේවායෝජකයකු විසින් ම, රුපියල් අටසිය අනූව සහ එම කම්කරුවා විසින් ඒ මාසය සඳහා ලබා ගන්නා වැටුප හෝ වේතනය අතර ඇති වෙනසට සමාන මුදලක්, 1976 ජනවාරි මාසය ද ඇතුළු එක් එක් මාසය වෙනුවෙන් එම කම්කරුවාට දීමනාව වශයෙන් ගෙවනු ලැබිය යුතු ය.

5. මේ නියෝගවල ඉහතින් වූ විධිවිධානවල කුමක් සඳහන් වුව ද එහි සඳහන් කර ඇති දීමනාව—

(අ) 1967 අංක 5 දරන සාමූහික ගිවිසුම අදාළ වන ;

(ආ) (අ) ඡේදයෙහි සඳහන් කරනු ලැබූ සාමූහික ගිවිසුම යටතේ ගෙවිය යුතු ප්‍රමාණයට වඩා අඩු වාසිසහගත නොවන වේතන සහ අනාවර්ත ජීවන වියදම් පාරිතෝෂිකයක් සේවායෝජකයා විසින් ස්වේච්ඡාවෙන් හෝ අන්‍යාකාරයකින් ගෙවනු ලබන ;

(ඇ) කොළඹ පාරිභෝගිකයන්ගේ මිල දර්ශකය අනුව නිශ්චය කරන ලද ජීවන වියදම් දීමනාවක් සේවායෝජකයා විසින් ගෙවනු ලබන ;

(ඈ) 1969 අංක 6 දරන පනතින් සංශෝධිත 1963 අංක 4 දරන දේශීය ආදායම් බදු පනතේ 16අ වන වගන්තිය යටතේ අනුමත පුණ්‍යායතනයක් වශයෙන් ප්‍රකාශිත ආයතනයක සේවයෙහි නියුක්ත කරනු ලබන ;

(ඉ) යම් සේවායෝජකයකු විසින් සේවයෙහි නියුක්ත කර ඇති කම්කරුවන් සංඛ්‍යාව විසිපස්දෙනකුට අඩුවන අවස්ථාවක 1971 සැප්තැම්බර් මස 10 වන දින හා අංක 14,975 දරන ගැසට් පත්‍රයේ පළ කරනු ලැබූ යම් සාමූහික ගිවිසුමක් පිළිබඳව කාර්මික ආරාවුල් පනතේ 10(2) වන වගන්තිය යටතේ වූ නියෝගයකින් ඒ සේවායෝජකයා බැඳී ඇති සහ එම සේවායෝජකයා විසින් ඒ ගිවිසුම් ප්‍රකාර වැටුප් සහ අනාවර්තන ජීවන වියදම් පාරිතෝෂිකයක් ගෙවනු ලබන ;

කම්කරුවකුට ගෙවනු නොලැබිය යුතු ය.

6. යම් කර්මාන්තයක නියුක්ත යම් කම්කරුවකුට මේ නියෝග යටතේ ගෙවිය යුතු මුදල, යම් ලිඛිත නීතියක කාර්යයන් සඳහා ඔහුගේ වේතනයෙන් කොටසක් වන ලෙස සලකනු ලැබිය යුතු අතර ඒ අනුව ඒ කම්කරුවාගේ වේතන ගෙවීමට සේවායෝජකයා බැඳී සිටින කාලය තුළ ඔහු විසින් ඒ මුදල ගෙවිය යුතු ය.

7. 1976 ජනවාරි මස 1 වන දිනට පෙරාතුව ම යම් සේවායෝජකයකු විසින් යම් කර්මාන්තයක සේවයෙහි නියුක්තකර ඇත්තා වූ සෑම කම්කරුවකු ම, ඔහු ඒ සේවායෝජකයාගේ කම්කරුවකු වශයෙන් සිටිනතාක් කල්, 1976 ජනවාරි මස 1 වන දිනට පෙරාතුව ම වූ දිනයෙහි ඔහු ලබමින් සිටි වැටුප, දීමනා හෝ කවර වූ හෝ නාමයකින් හෝ අභිධානයකින් හෝ හඳුන්වනු ලබන මුදලින් කරන ලද වෙනත් ගෙවීම්වලට අදාළ නියම හා කොන්දේසිවලට නොඅඩු වාසිසහගත තත්ත්වයෙන් යුත් නියම හා කොන්දේසි මත ඒ සේවායෝජකයා විසින් එසේ නොකඩවා සේවයෙහි නියුක්ත කරනු ලැබිය යුතු අතර, මෙම නියෝග යටතේ ගෙවිය යුතු දීමනාව ඒ වැටුප, දීමනාව හෝ වෙනත් ගෙවීම්වලට අතිරේකව විය යුතු ය.

8. 4 වන නියෝගය යටතේ කම්කරුවකුට ගෙවීමට නියමිත මුදල් කිසිවක් ගෙවීම යම් සේවායෝජකයකු විසින් පැහැර හරිනු ලැබීමේ හේතුවෙන් අධිකරණයක් විසින් ඒ සේවායෝජකයා වරදකට වරදකරු කරනු ලැබූ විට, අධිකරණය විසින් ඒ වරද සඳහා නියම කරනු ලැබිය හැකි වෙන යම් දණ්ඩනයකට අතිරේකව, ආඥාවෙහි සඳහන් කාලයක් ඇතුළත ඒ මුදල ඒ කම්කරුවාට ගෙවන ලෙස එම අධිකරණය විසින් ඒ සේවායෝජකයාට අණ කළ හැකි අතර ඒ මුදල එසේ ගෙවනු නොලැබුවහොත්, එය අධිකරණය විසින් නියම කරනු ලැබූ දඩයක් මෙන් අධිකරණයේ ආඥාව පිට අයකර ගත හැකි ය.

9. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස, මෙම නියෝගවල—

'' කොමසාරිස්වරයා '', '' සේවායෝජකයා '' හා '' වේතන '' යන්නෙහි (136 වන අධිකාරය වූ) පඩි පාලක සභා ආඥා පනතෙහි ඒ සඳහා පිළිවෙලින් දී ඇති අර්ථ ම ඇත්තේ ය ;

'' සාමූහික ගිවිසුම '' යන්නෙහි කාර්මික ආරාවුල් පනතේ ඒ සඳහා දී ඇති අර්ථය ම ඇත්තේ ය ;

'' සමූපකාර සමිතිය '' යන්නෙන්, ජාතික රාජ්‍ය සභාවේ 1972 අංක 5 දරන සමූපකාර සමිති පනත යටතේ ලියාපදිංචි කරනු ලැබූ හෝ ලියාපදිංචි කරන ලදැයි සලකනු ලබන සමූපකාර සමිතියක් අදහස් වේ ;

'' ඉපයීම් '' යන්නෙහි 1958 අංක 15 දරන සේවක අර්ථසාධක අරමුදල් පනතෙහි ඒ සඳහා දී ඇති අර්ථය ම ඇත්තේ ය ;

'' කර්මාන්තය '' යන්නට සේවායෝජකයකු විසින් හෝ කම්කරුවකු විසින් හෝ පවත්වා ගෙන යනු ලබන, ඉටු කරනු ලබන හෝ කර ගෙන යනු ලබන යම් කාර්මික ව්‍යාපාරයක්, වෙළඳ ව්‍යාපාරයක්, ව්‍යාපාරයක්, ව්‍යාපෘතියක්, වෘත්තියක් හෝ ජීවනෝපායක් සහ යම් කර්මාන්තයක යම් අංශයක් හෝ එබන්දක යම් කටයුත්තක් හෝ ක්‍රියාවලියක් ඇතුළත් වන නමුත්, සේවායෝජකයකුගේ තත්ත්වයෙන් ආණ්ඩුව විසින් සම්පූර්ණයෙන් ම ප්‍රාග්ධනය සපයනු ලැබූ යම් සංස්ථාගත හෝ සංස්ථාගත නොවූ මණ්ඩලයක් විසින් පවත්වා ගෙන යනු ලබන හෝ බලාපරාධකරුවනට හෝ අනත් දරුවනට හෝ අසරණ, ගොළු, බිහිරි හෝ අන්ධ තැනැත්තන් හට කාර්මික පුහුණුවක් ලබා දීමේ කාර්යය සඳහා ප්‍රධාන වශයෙන් පවත්වා ගෙන යනු ලබන යම් කර්මාන්තයක්, වෙළඳ ව්‍යාපාරයක් හෝ ව්‍යාපාරයක් ඊට ඇතුළත් නොවේ ;

''කම්කරුවා'' යන්නෙන් යම් කර්මාන්තයක, කාර්මික ව්‍යාපාරයක, වෙළෙඳ ව්‍යාපාරයක, ව්‍යාපෘතියක හෝ ජීවනෝපායක යම් වැඩක් වාචික වූ හෝ ලිඛිත වූ හෝ ප්‍රකාශිත වූ හෝ ගම්‍යමාන වූ හෝ ගිවිසුමක් යටතේ කිරීමට යම් සේවායෝජකයකු විසින් සේවයෙහි නියුක්ත කර ඇති තැනැත්තකු අදහස් වන අතර එයට යම් ලිඛිත නීතියකින් හෝ අන්‍යාකාරයකින් වැටුප් හෝ වේතන විධිමත් කරනු ලැබූ කම්කරුවකු සහ කැලි ප්‍රමාණය අනුව ගෙවීමට සේවයෙහි නියුක්ත කර ඇති කම්කරුවකු ඇතුළත් වන නමුත්, ගෘහ සේවකයකු හෝ සේවායෝජකයකුගේ පෞද්ගලික රියදුරකු එයට ඇතුළත් නොවේ.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

# ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 243/40 — 1976 දෙසැම්බර් 17 වැනි සිකුරාද — 1976.12.17

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය — සාමාන්‍ය

## ආණ්ඩුවේ නිවේදන

ජනා. කා. අංකය : ඩබ්ලිව්. 68 (70)/76.

### (40 වන අධිකාරය වූ) මහාජන ආරක්ෂක ආඥාපනත

අගමැතිගේ නිර්දේශය අනුව මහාජන ආරක්ෂක ආඥාපනතේ 5 වන වගන්තිය යටතේ ජනාධිපතිවරයා විසින් සාදනු ලැබූ නියෝග.

වී. ගොපල්ලව,
ජනාධිපතිවරයා.

1976 දෙසැම්බර් මස 17 වන දින,
කොළඹ දී ය.

නියෝග

1. (1) මේ නියෝග හදිසි අවස්ථා (ආහාර බෝග වගා කිරීමේ) නියෝග යනුවෙන් හඳුන්වනු ලැබේ.

(2) යම් කෘෂිකාර්මික ඉඩමක් වගා කිරීමට අදාළ වෙනත් යම් ලිඛිත නීතියක් හෝ යම් චාරිත්‍රයක් නොතකා මේ නියෝග බල පවත් වන්නේ ය.

2. (1) මෙහි උපලේඛනයෙහි සඳහන් ආහාර බෝග අතුරින් යම් කිසි බෝගයක් එය වගා කිරීමට අදාළව නියම බලධරයා විසින් නිකුත් කරනු ලබන යම් විධානයකට යටත්ව, වගා නොකළා වූ හෝ අඩුවෙන් වගා කළා වූ හෝ කෘෂිකාර්මික ඉඩමක වගා කිරීම, එම ඉඩමෙහි අයිතිකරුගේ හෝ එම ඉඩම පරිහරණය කරන්නාගේ හෝ යුතුකම වන්නේ ය ;

එසේ වුව ද, වගා නොකළා වූ හෝ අඩුවෙන් වගා කළා වූ හෝ කෘෂිකාර්මික ඉඩමක අයිතිකරු විසින් හෝ එම ඉඩම පරිහරණය කරන්නා විසින්, කෘෂිකර්ම අධ්‍යක්ෂවරයා අනුමත කළ වෙනත් යම් බෝග වර්ගයක්, නියම බලධරයාගේ ලිඛිත අවසරය ඇතිව ඒ ඉඩමෙහි වගා කළ හැකිය.

(2) (1) වන ඡේදය යටතේ නිකුත් කරන ලද යම් විධානයක් එම කෘෂිකාර්මික ඉඩමෙහි අයිතිකරුගේ හෝ එය පරිහරණය කරන්නාගේ අන්තිමට දන්න-සිටි ලිපිනයට ලියාපදිංචි කළ තැපෑලෙන් යවන ලද නම් එම විධානය එම අයිතිකරු හෝ පරිහරණය කරන්නා වෙත භාර දෙනු ලැබූ ලෙස සැලකිය යුතුය :

එසේ වුව ද, එම ඉඩමෙහි අයිතිකරුවන් සහ පරිහරණය කරන්නන් කීප දෙනෙකු සිටින්නා වූ හෝ එම ඉඩමෙහි අයිතිකරු වන් හෝ පරිහරණය කරන්නන් නිශ්චය කර ගත නොහැක්කා වූ අවස්ථාවක එම විධානය අදාළ වන ඉඩමේ හෝ එම ඉඩම මත පැහැදිලිව පෙනෙන ස්ථානයක එම විධානය ප්‍රදර්ශනය කිරීම, අවස්ථාවෝචිත පරිදි, එම ඉඩමෙහි අයිතිකරුවන් වෙත හෝ පරිහරණය කරන්නන් වෙත එම විධානය සැහෙන අන්දමින් භාරදීමක් සේ සැලකිය යුතුය.

3. යම් කෘෂිකාර්මික ඉඩමක් 2 වන නියෝගයේ විධිවිධානවලට හෝ එය යටතේ නිකුත් කරනු ලැබූ යම් විධානයකට හෝ අනුකූලව වගා නොකරන බවට නියම බලධරයා සෑහීමට පත් වූ අවස්ථාවක නියම බලධරයා විසින් නිශ්චය කරනු ලබන සාධාරණ බිම් බද්දක් ගෙවීමෙන් හෝ අස්වැන්නෙන් සාධාරණ කොටසක් දීමෙන් එම ඉඩමේ සන්තකය ගැනීමට ද එම ඉඩම සන්තකයට ගැනීමෙහි ලා අවශ්‍ය යැයි ඔහු විසින් සලකනු ලබන සියලු පියවර ගැනීමට සහ අවශ්‍ය යැයි ඔහු විසින් සලකනු ලබන යම් බලයක් පාවිච්චි කිරීමට ද නියම බලධරයාට මෙයින් බලය දෙනු ලැබේ. තමා ලබාගැනීමට වඩා කැමති වන්නේ අස්වැන්නෙන් කොටසක් ද නැතහොත් බිම් බද්ද ද යන්න තීරණය කිරීමට ඉඩමේ අයිතිකරුට '' හෝ ඉඩම පරිහරණය කරන්නාට '' හිමිකම් තිබේ.

4. යම් කෘෂිකාර්මික ඉඩමක සන්තකය ලබා ගැනීමට 3 වන නියෝගයේ විධිවිධාන යටතේ නියම බලධරයාට බලය පැවරී ඇති යම් අවස්ථාවක ඔහු විසින් එහි සන්තකය ලබා ගැනීමට පෙර, එම ඉඩම පවරා නොගත යුත්තේ මන්දැයි හේතු දක්වන ලෙස එම ඉඩමෙහි අයිතිකරුගෙන් හෝ එය පරිහරණය කරන්නාගෙන් ඉල්ලා සිටිය හැකි අතර, එම අයිතිකරු හෝ පරිහරණය කරන්නා ප්‍රමාණවත් බව නියම බලධරයාට පෙනී යන හේතු දක්වා, එම ඉඩම නිසි ලෙස සහ විධිමත්ව වගා කෙරෙන බවට වග බලා ගැනීම පිණිස පැනවීම අවශ්‍ය යැයි නියම බලධරයා අදහස් කරන නියමයන්ට සහ කොන්දේසිවලට අනුකූලව ක්‍රියා කරන බවට නියම බලධරයා සෑහීමට පත්වන ලියවිල්ලකින් වූ පොරොන්දුවකට ඇතුළත් වන අවස්ථාවක 3 වන වගන්තිය යටතේ එම ඉඩම සන්තකය ට ගැනීම නියම බලධරයා විසින් නොකර සිටිය හැකිය.

95A—— ඒ 24284—2,600 (76/12)